# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
## 2012 සැප්තැම්බර් මස 18 වන දින පෙ.ව 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිතුමාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ කටයුතු විෂය භාර අමාත්‍යතුමාගෙන් 2012.08.07 දින අසන ලද ප්‍රශ්නය:** (ප්‍ර/V (1)12/18)

අ. කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වැලිහේන දේවස්ථාන භූමියේ ඔබ අමාත්‍යාංශයේ අරමුදල් මඟින් රුපියල් මිලියන හතක් (රු.7,000,000/-) වැය කර ඉදිකල සුපිරි වෙළඳ සැල (සුපර් මාකට්) ඉදිකිරීමට අදාළව කටාන ප්‍රාදේශීය සභාව විසින් ගිවිසුමක් ඇතිකර ගෙන තිබේද?

ආ. ඔබ අමාත්‍යාංශ අරමුදල් යොදා රජයට හෝ පළාත් සභාවට අයත් නොමැති පුද්ගලික ඉඩමක ඉදිකිරීම් සඳහා අවසර දිය හැකිද ?

ඇ. එකී ගිවිසුම අනුව කටාන ප්‍රාදේශීය සභාවට ලැබෙන ප්‍රතිලාභ කවරේද ?

ඈ. එකී සුපිරි වෙළඳ සැල ඉදිකිරීම නීති විරෝධී වන්නේද ?

ඉ. එකී ඉදිකිරීම සඳහා වැය කළ රුපියල් මිලියන හතක (රු.7,000,000/-) මුදල සම්බන්ධව සහ ඊට අනුමැතිය දීම සම්බන්ධව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග කවරේද ?

**02. ගරු සරත් පතිරණ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ කටයුතු විෂය භාර අමාත්‍යතුමාගෙන් 2012.08.21 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/V (1)12/19)**

අ. මොරටුව මහ නගර සභාවේ නගරාධිපතිතුමා ඇතුළුව නාගරික මන්ත්‍රීවරුන් දොළොස් දෙනෙකු 2012 ජූලි 14 සිට 21 දක්වා ඉන්දුනීසියාවේ සංචාරයකට සහභාගි වී ඇති බව ඔබතුමා දන්නේද?

ආ. i. මෙම මහජන නියෝජිත පිරිස එම සංචාරයට සහභාගී වී ඇත්තේ කිනම් කටයුත්තක් සඳහාද ?
ii. එය සංවිධාන කරනු ලැබුයේ කිනම් ආයතනයක් විසින්ද? යන්න, මෙම ගරු සභාවට පැහැදිලි කරන්නේද ?

ඇ. i. මෙම සංචාරය සඳහා මුදල් ප්‍රතිපාදන සපයා ගෙන ඇත්තේ කෙසේද ?
ii. එම මුදල් ප්‍රමාණය කොපමණද ?

ඈ. මෙම සංචාරය සඳහා මොරටුව මහ නගර සභාවේ මුදල් වියදම් කර ඇත්නම් එම මුදල් ලබා ගැනීමේදී මහ නගර සභා ආඥා පනතේ 28 වැනි වගන්ති ප්‍රකාරව කටයුතු කර තිබේද ?

ඉ. මෙම සංචාරය සඳහා නිවාඩු අනුමත කර ගැනිමේදී මු.ක්‍ර.අ.01/2010/01 දරන චක්‍රලේඛය අනුව කටයුතු කර නොමැති බව ඔබතුමා පිළිගන්නේද?

ඊ. මෙම සංචාරයට අදාළව සිදුවී ඇති අක්‍රමිකතා සහ මූල්‍ය වංචා පිළිබඳව 2012.07.20 වැනි දින මොරටුව මහ නගර සභා මන්ත්‍රී නිශාන්ත ප්‍රදීනාන්ද්‍ර මහතා ඔබතුමා වෙත එවා ඇති ලිපියට අනුව ඔබතුමා ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද?

**03. ගරු ඊ සිරිකමල් පිලිෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ කටයුතු විෂය භාර අමාත්‍යතුමාගෙන් 2012.08.21 දින අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/V (1)12/20)**

අ. 2012 වසරේ පළමු වැනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරිමේදී මෙම පළාත් සභාවට අයත් පාසැල් වල බලධාරීන් විසින් මුදල් අය කළ බවට පැමිණිලි ලැබී තිබේද?

ආ. i. එසේ පැමිණිලි ලැබුණි නම් එම පාසැල් සංඛ්‍යාව කොපමණද ?
ii. ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද ?

ඇ. එම පැමිණිලි පිළිබඳව පරීක්ෂණයක් කර තිබේද?

ඈ. එසේ කරන ලද පරීක්ෂණයේදී මුදල් ලබා ගත් බවට හෙළිවූ පාසැල් මොනවාද ?

ඉ. නැවත එම මුදල් දෙමාපියන් වෙත ගෙවන ලද පාසැල් මොනවාද?

ඊ. i. මේ පිළිබඳව විදුහල්පතිවරුන් වෙත අවවාද ලිපි නිකුත් කර තිබේද ?
ii. තිබේ නම් ඒ කුමන විදුහල්පතිවරුන් වෙතද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ කටයුතු

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

*"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"*

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය :**

" රට තුළ කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා වත්මන් රජය විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරමින් පවතී. " අපි වවමු රට නගමු ", " දිවි නැගුම " හා " පොහොර සහනාධාර ලබාදීම " වැනි ව්‍යාපෘති මඟින් ඉහළ එළවළු හා පළතුරු ඵලදාවක් ලැබෙමින් පවතී. ඵලදාව නෙලන කාලයේදී එළවළු හා පළතුරු පහසු මිලකට ලබා ගත හැකි අතර, එම කාලවලදී අතිරික්ත ඵලදාව නිෂ්ප්‍රයෝජන ලෙස විනාශ වන අවස්ථා දක්නට ඇත. එම තත්ත්වය ගොවීන්ට පාරිභෝගිකයන්ට මෙන්ම රටේ සමස්ත ආර්ථිකයට අහිතකර ලෙස බලපායි. එබැවින් ආහාර භෝග නිෂ්පාදන කල් තබා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේද සකස් කර ගොවීන් වෙත හඳුන්වා දීමෙන් ගොවීන්ට සිදු වන පාඩුව මඟහැර වීමටත්, පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට නිෂ්පාදන මිලදී ගැනීමට අවස්ථාව සැලසීමටත් පියවර ගත යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "

**(යෝ/v(01)12/08)**

**02. ගරු ඒ.එම් යූසුෆ් මන්ත්‍රීතුමා :**

" බස්නාහිර පළාතේ පළාත් සභා බල ප්‍රදේශය තුල දැනට ක්‍රියාත්මකව පවතින රෝහල්, වර්ගීකරණයකට ලක්ව පැවතුනත් ඒවායේ ගුණාත්මක තත්වයන් පිළිබඳව වඩාත් සැලකිලිමත් විය යුතුව ඇත. විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කය තුල මතුගම, අගලවත්ත, වලල්ලාවිට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවතින රෝහල්, පිහිටා ඇති ප්‍රදේශවල ජීවත්වන ජනයා ඉතා අඩු ආදායම් ලාභීන් වන අතර, එම ප්‍රදේශ දුෂ්කර ප්‍රදේශද වේ. එලෙස පවත්නා දුෂ්කර තත්වයන්ද සැලකිල්ලට ගෙන එම ප්‍රදේශයන්හි පිහිටා ඇති රෝහල් වල තත්වය උසස් කිරීම පිළිබඳව අවධානය යොමු කළයුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි. "

**(යෝ/v(01)12/10)**

## XI. පොදු කටයුතු

**ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ කටයුතු විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය**

*"බස්නාහිර පළාත් සභාවේ 2012 අංක ...... දරණ පෙර පාසැල් ප්‍රඥප්තිය"*

(ප්‍රඥප්තිය පළමුවර කියවීම)

බස්නාහිර පළාත තුළ පෙර පාසැල් ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, පරිපාලනය කිරීම හා මෙහෙයවීම සඳහාද, ආදර්ශ පෙර පාසැල් හඳුන්වාදීම සඳහා සහ ඊට ආනුශාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාද, 2003 අංක 04 දරණ පෙර පාසැල් ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා ද වූ ප්‍රඥප්තියකි.

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2012.08.30
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

File Name :- C:\Users\ishani maddumage\Documents\Office\Council\Agenda - 2012.08.022docx